# ගෙවතු අසිරි මවමු

# වට්ටක්කාවෙන්



උදයට පැයක් ගෙමිදුලේ සැරි සැරුවා
හවසට වුනත් විගසින් ගෙදරට දිව්වා
ගහ කොළ මගේ මා එනතුරු මග බැලුවා
ගෙවතු අසිරියෙන් මා දිරිමත් වුවා

කල් යල් බලා පොඩි පොඩි වලවල් කැපුවා
හැකි පමණින් කසලින් එය පිරවුවා
නොදැන වුවත් වල ටික ටික ගොඩ වුවා
වට්ටක්කා ඇට දෙකක් එහි මැද සිටවුවා

දින දෙක තුනෙන් පියලි දෙකක් එහි මතු වුවා
හිතේ සතුට ඒ මොහොතේ වැඩි වුවා
පස් ටික ටික ලංකර පැලය ද දැමුවා
බලා ඉද්දිද්දී වැල මට අත වැනුවා

දුරුවා නිසා පොඩ්ඩක් තරවටු කරලා
අගාලේ නොයා නිවැරදි මග පෙන්නාලා
මගේ මනාපෙට වැල පොඩ්ඩක් හරවාලා
යන හැටි බලා සිටියා දින දින ඇදිලා

රිකිලි කඩා දලු ටික මැල්ලුම් කන්නයි
කොස් ඇට දමා ඉව්වොත් රස වැඩි වෙන්නයි
වැලේ රිකිලි එකිනෙක වැඩි කර ගන්නයි
ගෑණි මල් වලින් මේ වැල සපිරෙන්නයි

යන එන අතර පිපෙන ගෑණි මල් දුටුවා
සතුටක් දැනේ හෙට ඒ මල් පුදිනවා
වසා මනා ලෙස ඒ ගෑණි මල් අසුරනු ගොදවා
රැක ගත යුතුයි ඉල් මැස්සන් පලවා හරවා

කහපාටින් පිපුණු මලක පෙති ගලවා
දහයට පෙර පරාගනය කළ යුතු වෙනවා
එහෙම වුනොත් වට්ටක්කා පුදිනවා
පමා වුනොත් මල් සේරම පර වෙනවා

ටික ටික හෙමින් ගෙඩි දැන්නම් ලොකු වෙනවා
මැස්සන් ටිකින් ටික අඩු වැඩි කර දෙනවා
බලා ඉද්දිද්දී ගෙඩි වල ඇළු මතු වෙනවා
නාඹර වියේ වල දරුවන් පසු වෙනවා

කොටහක් කපා අහල පහලටත් බෙදලා
කොටහක් කපා පොල් අඹරා හෙම උයාලා
බැලුවා රසැති නව නිපැයුම් අත්හදලා
ඉදිරි දිනක පවසන්නම් රස බලලා

ඊලඟ කන්නයෙන් සිටුවා එය ගන්න
පැසුණු බීජ සෝදා පවනේ වේලා ගන්න
හැකි වුවහොත් ඉල්ලූ කෙනෙකුට දෙන්න
බීජ ටිකක් පරිස්සමට අසුරා ගන්න

සතුට මගේ ගෙවත්තේම රැඳෙන්නයි
මිහිර මගේ නව නව පැළ හදන්නයි
දැනුම මගේ අන් අයටත් බෙදන්නයි
පැතුම මගේ රටටත් ගෙවතු වැවෙන්නයි

වට්ටක්කාවෙන් ගෙවත්ත සරු කළේ,
**සාගරිකා රත්නමලල**
**කෘෂිකර්ම උපදේශිකා**
**උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය**